**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

# බලපත්‍ර අවලංගු කළ /අත්හිටවූ මූල්‍ය සමාගම්වල තැන්පත්කරුවන් වෙත කෙරෙන දැනුම්දීමයි

(සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී., ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්, ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ්, ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී, ඊ.ටී.අයි. ෆිනෑන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී. යන ආයතනවල තැන්පතුකරුවන්ගේ අවධානය පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම නිවේදනය නිකුත් කෙරේ.)

2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ 37 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී., ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්, ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ් සහ ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී. යන ආයතන වෙත මුදල් ව්‍යාපාර කටයුතු සඳහා නිකුත් කර තිබූ බලපත්‍ර පිළිවෙළින් 2018.03.05, 2018.07.25, 2019.09.19 සහ 2020.05.22 යන දිනවල දී අවලංගු කරන ලද අතර, ඊ.ටී. අයි. ෆිනෑන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී. යන ආයතන දෙකෙහි ව්‍යාපාර කටයුතු 2020.07.13 දින සිට අත්හිටුවන ලදි.

ඒ අනුව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය සම්බන්ධව එවකට පැවති විධිවිධාන ප්‍රකාරව එක් අයෙකුට රුපියල් 600,000/-ක උපරිමයකට යටත්ව එකී ආයතනවල තැන්පත්කරුවන්ට/අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන්ට රක්ෂණ වන්දි ගෙවීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවර ගන්නා ලදි.

එම ආයතනවල තැන්පතුකරුවන්ට තව දුරටත් සහන සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ පිරිනමනු ලබන උපරිම වන්දි මුදල් සීමාව රුපියල් ලක්ෂ හය (600,000/-) සිට රුපියල් ලක්ෂ එකොළහ (1,100,000/-) දක්වා ඉහළ දැමීමට නොබෝදා රැස්වූ මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදි.

ඒ අනුව එම නව සීමාව යටතේ සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී., ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්, ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ් යන ආයතනවල තැන්පතුකරුවන්ට/අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන්ට ගෙවිය යුතු ඉතිරි වන්දි මුදල් ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හරහා අදාළ තැන්පතුකරුවන්ගේ බැංකු ගිණුම්වලට සෘජුව ම බැර කරනු ලැබේ. ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී., ඊ.ටී. අයි. ෆිනෑන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී. යන ආයතනවල තැන්පත්කරුවන් සඳහා ගෙවනු ලබන අදාළ වැඩි කරන ලද වන්දි මුදල් පෙර ආකාරයෙන් ම නියෝජිත බැංකුව වන මහජන බැංකුව වෙතින් ලබා ගැනීමට කටයුතු සලස්වනු ලැබේ.

**නියෝජිත බැංකුව වන මහජන බැංකුව හරහා වැඩි කරන ලද රක්ෂණ වන්දි මුදල් ගෙවීම් ක්‍රියාවලිය**

ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී., ඊ.ටී.අයි. ෆිනෑන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී. යන ආයතනවල රුපියල් 600,000/- ට වැඩියෙන් මුදල් තැන්පත් කර තිබූ තැන්පත්කරුවන්ට ඉතිරි වන්දි මුදල රුපියල් උපරිමය 500,000/- ක් දක්වා මහජන බැංකුව හරහා ලබා ගත හැකි වේ.

ඒ අනුව ඊ.ටී.අයි. ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ තැන්පත්කරුවන්ට/අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන්ට 2021.04.09 දින සිටද ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී. ආයතනයේ තැන්පත්කරුවන්ට/අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන්ට 2021.04.12 දින සිටද ද රක්ෂණ වන්දි ලබා ගත හැකි වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පත් කරන ලද කළමණාකරන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ දැනට ක්‍රියාත්මක වන ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී. යන ආයතනයේ තැන්පතුකරුවන්ට තැන්පතු ආපසු ගෙවීමේ වැඩ පිළිවෙල නියමිත කාලය තුළ දී අවසන් වූ වහාම ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී. ආයතනයේ තැන්පත්කරුවන්ට/අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන්ට හිමි රක්ෂණ වන්දි ගෙවීම් ආරම්භ කරන දිනය දැනුම් දෙනු ලැබේ.

තැන්පතු සහතික වල මුල් පිටපත්, අදාළ හැඳුනුම්පත් යනාදි අවශ්‍ය ලියකියවිලි නිසි ලෙස ඉදිරිපත් කොට දැනට ඊ.ටී.අයි. ෆිනෑන්ස් ලිමිටඩ් සහ ද ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී. ආයතන වල අදාළ තැන්පතුකරුවන්/ අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන් එම රක්ෂණ වන්දි මුදල් මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙතින් ඉල්ලුම් කල හැකිය. (එසේ වුවද එම රක්ෂණ වන්දි මුදල් මීට පෙර වන්දි මුදල් ලබා ගත් මහජන බැංකු ශාඛාව වෙතින්ම මෙවරද ඉල්ලුම් කිරීම වඩාත් පහසු විය හැකිය.)

**ශ්‍රී ලංකා මහ බැංකුව හරහා ඉතිරි රක්ෂණ වන්දි මුදල් ගෙවීම් ක්‍රියාවලිය**

වන්දි මුදල් සඳහා අයදුම් කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මීට පෙර ලබා දී ඇති තොරතුරු එලෙසින් ම භාවිත කිරීම සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශ කරන ලෙස සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී., ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් සහ ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ් යන ආයතනවල රුපියල් 600,000/- ට වැඩියෙන් මුදල් තැන්පත් කර තිබූ සහ එසේ ම දැනටමත් පැරණි සීමාව යටතේ වන්දි මුදල් ලබා ගත් තැන්පත්කරුවන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.

ඒ සඳහා නිසි ලෙස සම්පූරණ කොට ඉදිරිපත් කළ යුතු කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරමය මේ සමඟ ඇති අතර අවශ්‍ය නම් එහි පිටපත්/මුල් අයදුම්පත් මහ බැංකු වෙබ් අඩවිය වන www.cbsl.gov.lk වෙතින් මෙන් ම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලය සහ මාතලේ, මාතර, අනුරාධපුර, ත්‍රිකුණාමලය, නුවරඑළිය, සහ කිලිනොච්චි යන නගරවල පිහිටි අපගේ ප්‍රාදේශීය කාර්යාලවලින් ද ලබා ගත හැකි ය.

එහි දී බද්ධ ගිණුම් හිමිකරුවන් ද ඇතුළුව සෑම තැන්පතුකරුවෙකු/හිමිකම්ලාභියෙකු ම විසින් ඒ ඒ ආයතනයට අදාළව වෙන වෙන ම කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරම ඉදිරිපත් කළ යුතු ය. තමන්ට හිමි රුපියල් 600,000/- ක මුල් වන්දි මුදල ලබා ගැනීමෙන් පසු අදාළ ස්ථිර තැන්පතු සහතික සහ ඉතුරුම් පාස් පොත්වල මුල් පිටපත් ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ආපසු ලබා ගත් තැන්පතුකරුවන්/ අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන් විසින් තම කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරමය සමග එම සියලු සහතික සහ ඉතුරුම් පාස්පොත් නැවත ඉදිරිපත් කළ යුතු ය.

කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරමය නිසි ලෙස පුරවා 2021.04.20 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට එවීමට හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ බිම් මහලේ පිහිටි කවුන්ටරය වෙත ගෙනැවිත් භාර දීමට හෝ හැකි ය. එම පෝරමය බහා එවන ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ "සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. (CIFL)", "ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් (TSFL)" හෝ "ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ් (TKSFL)" ලෙස තමාට අදාළ වන ආයතනයේ නම පැහැදිලිව සඳහන් කළ යුතු ය.


**අධ්‍යක්ෂ**
**නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**අංක. 30, ජනාධිපති මාවත**
**කොළඹ 01**


**මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර පහත සඳහන් දුරකථන අංක ඔස්සේ ලබා ගත හැකි ය.**
**011 – 2477261**
**011 – 2398788**
**011 – 2477000**

---

## කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරමය

**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ෆිනෑන්ස් පී.එල්.සී., ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් සහ ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ් යන ආයතනවල තැන්පතුකරුවන් සඳහා රක්ෂණ වන්දි මුදල් ගෙවීම**

**නිළ හැඳුනුම් අංකය**
**(කාර්යාලීය ප්‍රයෝජනය සදහා පමණි.)**

**පොදු උපදෙස්**

1. කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරමය අදාළ වන්නේ සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී., ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් සහ ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ් යන ආයතනවල රුපියල් 600,000/-ට වැඩියෙන් මුදල් තැන්පත් කර තිබූ දැනටමත් පැරණි සීමාව යටතේ වන්දි මුදල් ලබා ගත් තැන්පත්කරුවන්ට/හිමිකම්ලාභීන්ට පමණි.
2. කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරමය A, B සහ C යනුවෙන් වන කොටස් තුනකින් යුතු ය.
   - A කොටස - තැන්පත්කරු/ අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන් විසින් රුපියල් 600,000/-ක් වූ මුල් වන්දි මුදල් ලබාගැනීම සඳහා කලින් ඉදිරිපත් කළ අයදුම්පත, එහි ඇතුළත් වූ ප්‍රකාශය සහ වෙනත් අදාළ තොරතුරු මත පදනම්ව වැඩි කරන ලද වන්දි මුදල් ගෙවීමේ කටයුතු ආරම්භ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත කැමැත්ත ප්‍රකාශ කරමින් පෝරමයේ A කොටස නිසි පරිදි සම්පූර්ණ කළ යුතු ය.
   - B කොටස - රුපියල් 600,000/-ක් වූ මුල් වන්දි මුදල ලැබීමෙන් පසු තැන්පත්කරු/අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන් අදාළ තොරතුරු වෙනස් වී ඇත්නම් ඒ බව දැනුම්දීම සහ අදාළ නව තොරතුරු ලබා දීම සඳහා පෝරමයේ B කොටස නිසි පරිදි සම්පූර්ණ කළ යුතු ය.
   - C කොටස - රුපියල් 600,000/-ක් වූ මුල් වන්දි මුදල චෙක්පතක් මගින් ලබා ගත් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.හි තැන්පතුකරුවන්/නීත්‍යනුකූල හිමිකම්ලාභීන් පමණක් පෝරමයේ C කොටස සම්පූර්ණ කළ යුතු ය.
3. ඉතිරි වන්දි මුදල් ලබා ගැනීමට සුදුසුකම් ලැබීමට නම් රුපියල් 600,000/- ක් වූ මුල් වන්දි මුදල ලබා ගැනීමෙන් පසු ස්ථිර තැන්පතු සහතික සහ ඉතුරුම් පාස් පොත්වල මුල් පිටපත් ආපසු ලබා ගත් තැන්පත්කරුවන්/අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන් විසින්, කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරමය සමග එම මුල් පිටපත් නැවත ඉදිරිපත් කළ යුතු ය. මුල් වර වන්දි මුදල් ලබා ගැනීමේ දී තමන්ගේ මුළු තැන්පතු ප්‍රමාණයට අදාළ සියලු සහතික සහ ඉතුරුම් පාස් පොත් ඉදිරිපත් කිරීමට අසමත් වූ තැන්පතුකවන්/ අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන් වේ නම් ඔවුන් විසින් ද ඉතිරි වන්දි මුදල් ලබා ගැනීමට සුදුසුකම් ලැබීම සඳහා පහත 5 වන ඡේදයේ දැක්වෙන පරිදි නිසි පරිදි සම්පූර්ණ කරන ලද නව අයදුම්පතක් (ප්‍රකාශය ද සහිත) සමග එම සියලු අදාළ සහතික සහ ඉතුරුම් පාස් පොත් ඉදිරිපත් කළ යුතු ය.
4. බද්ධ තැන්පතු හිමියන් ඇතුළුව සෑම තැන්පත්කරුවෙකුම එක් එක් සමාගම සඳහා වෙන වෙනම කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරම ඉදිරිපත් කළ යුතු ය.
5. පහත දැක්වෙන අවස්ථාවල දී, නිසි පරිදි සම්පුර්ණ කරන ලද නව හිමිකම් අයදුම්පත සහ ප්‍රකාශය (මහ බැංකු වෙබ් අඩවිය වන www.cbsl.gov.lk පල කර ඇති) ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.
   - ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ වන්දි මුදල් ලබා ගැනීම සඳහා මේ වන තුරුත් හිමිකම් අයදුම්පත සහ ප්‍රකාශය ඉදිරිපත් කර නොමැති තැන්පත්කරුවන්/ අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන් හිමිකම්ලාභීන්.
   - වන්දි මුදල් බැර කිරීම සඳහා කලින් නම් කළ බැංකු ගිණුම වසා දැමූ හෝ එම ගිණුම භාවිත නොකරනු ලබන තැන්පත්කරුවන්/හිමිකම්ලාභීන් (චෙක්පත් මගින් වන්දි මුදල් ලබා ගත් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. ආයතනයේ තැන්පත්කරුවන්ට/අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන් මෙය අදාළ නොවේ).
   - සියලුම මුල් ස්ථාවර තැන්පතු සහතික හෝ ඉතුරුම් පාස් පොත් ඉදිරිපත් කර නොමැති හෝ කලින් ඉදිරිපත් කළ හිමිකම් අයදුම්පත සහ ප්‍රකාශය සමග සුදුසුකම් ලත් සියලුම තැන්පතු තොරතුරු නිවැරදිව ප්‍රකාශ කර නොමැති තැන්පත්කරුවන්/අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන්.
   - රුපියල් 600,000/-ක් වූ මුල් වන්දි මුදල ලබා ගැනීමෙන් පසු තැන්පතුකරු මිය ගොස් ඇති විටෙක එම මිය ගිය තැන්පතුකරු වෙනුවෙන් ඉතිරි වන්දි මුදල් සඳහා අයදුම් කරන අදාළ නීත්‍යනුකූල හිමිකම්ලාභීන්.
6. තනි පුද්ගල හෝ හෝ බද්ධ ගිණුම් හිමි තැන්පත්කරුවෙකු තමාගේ කැමැත්ත ප්‍රකාශ කිරීමේ පෝරමයක් ඉදිරිපත් කරන්නේ නම්, එහි A කොටසේ ප්‍රකාශන වගන්තිය (6 වැනි වගන්තිය) යටතේ ඇති හිමිකම්පාන්නාගේ හෝ නීත්‍යනුකූල හිමිකම්ලාභියාගේ නම් සහ තැන්පතුකරුගේ නම් යන දෙතැනෙහි ම තමාගේ නම සඳහන් කළ හැකි ය.

---

### A කොටස

**මුල් වන්දි මුදල ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ හිමිකම් අයදුම්පත සහ ප්‍රකාශයේ තොරතුරු මත පදනම්ව ඉතිරි වන්දි මුදල් ගෙවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව කැමැත්ත ප්‍රකාශ කිරීම.**

1. සමාගමේ නම: ..............................
2. තැන්පත්කරුගේ සම්පූර්ණ නම: ..............................
3. හඳුනාගැනීමේ අංක:

   ජාතික හැඳුනුම්පත අංකය /ව්‍යාපාර ලියාපදිංචි අංකය: ..............................

   විදේශ ගමන් බලපත්‍ර අංකය: .................. රියදුරු බලපත්‍ර අංකය: ..................
4. දුරකථන අංක: - ස්ථාවර .................. ජංගම ..................
5. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ ගෙවනු ලබන ඉතිරි වන්දි මුදල් මීට පෙර අයදුම්පත මගින් නම් කරනු ලැබූ බැංකු ගිණුමට ම ලබා ගැනීමට මෙයින් එකඟ වන අතර එසේ ලබා දී ඇති බැංකු ගිණුම් තොරතුරුවල නිරවද්‍යතාවයේ සම්පූර්ණ වගකීම මවිසින් භාර ගනිමි (කරුණාකර ඉහත කොටුව තුළ √ ලකුණ යොදන්න). ☐
6. ප්‍රකාශය

.............................. යන ලිපිනයෙහි පදිංචි.............................. (හිමිකම්පාන්නාගේ/ නීත්‍යනුකූල හිමිකම්ලාභියාගේ නම) වන මා විසින් .............................. (තැන්පත්කරුගේ නම) යන අය වෙනුවෙන් මෙම අයදුම්පත ඉදිරිපත් කරන බව ද මවිසින් මීට පෙර මෙම අයදුම්පතට අදාළ තැන්පතු සඳහා රු .600,000/ ක මුල් රක්ෂණ වන්දි මුදල ලබා ගත් බව ද මෙයින් සහතික කරමි. මා හට හිමි ඉතිරි වන්දි මුදල් කලින් රක්ෂණ වන්දි ගෙවීමේ දී මා මීට පෙර ඉදිරිපත් කළ හිමිකම් අයදුම්පත සහ ප්‍රකාශය සහ තොරතුරු මත පදනම්ව කටයුතු කිරීම සම්බන්ධයෙන් මාගේ පූර්ණ එකඟතාව ප්‍රකාශ කරමි.

තැන්පත්කරු/නීත්‍යනුකූල හිමිකම්ලාභියාගේ අත්සන: ..............................

ඉහත හිමිකම් පාන්නා/ නීත්‍යනුකූල හිමිකම්ලාභියා හට මෙහි අන්තර්ගතය කියවා තේරුම් කර දීමෙන් අනතුරුව ඔහු/ඇය විසින් අද දින එනම්.................. වැනි දින ..................දී මෙම ප්‍රකාශයට අත්සන් තබන ලද බව සහතික කරමි.

..............................

නීතිඥ/ප්‍රසිද්ධ නොතාරිස්/දිව්රුම් කොමසාරිස්/සාමදාන විනිශ්චයකාර

(නිල මුද්‍රාව)

### B කොටස

**(රු.600,000/ක් වූ මුල් රක්ෂණ වන්දි මුදල ලබාගැනීමෙන් පසු අදාළ තොරතුරු වෙනස් වී ඇති තැන්පතුකරුවන්/නීත්‍යනුකූල හිමිකම්ලාභීන් පමණක් මෙම B කොටස පිරවිය යුතු ය.)**

1. සමාගමේ නම:-..............................
2. තැන්පත්කරුගේ නම:-..............................
3. හිමිකම්පාන්නාගේ/නීත්‍යනුකූල හිමිකම්ලාභියාගේ නම:- ..............................
4. වත්මන් ලිපිනය: ..............................
5. දුරකථන අංක :- ස්ථාවර .................. ජංගම ..................
6. ඉතිරි වන්දි මුදල් ගෙවීමේ දී අදාළ කර ගත යුතු වෙනත් තොරතුරු වෙනස්වීම් තිබේ නම් සඳහන් කරන්න. ..............................
7. කලින් ඉදිරිපත් කරන ලද බැංකු ගිණුම වසා දමා හෝ දැනට ක්‍රියාත්මක නොවන්නේ නම්, නිසි පරිදි සම්පූර්ණ කරන ලද නව අයදුම්පතක් සමඟ වෙනත් ක්‍රියාකාරී බැංකු ගිණුමක විස්තර ඉදිරිපත් කළ යුතු ය. ( චෙක්පත් මගින් මුල් වන්දි මුදල් ලබා ගත් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. ආයතනයේ තැන්පත්කරුවන්ට මෙය අදාල නොවන අතර ඔවුන් විසින් පහත දැක්වෙන C කොටස සම්පූර්ණ කළ යුතු වේ.) ඉහත කරුණු තේරුම් ගෙන එකඟ වන බවට සහතික කරමි.

   තැන්පත්කරු/නීත්‍යනුකූල හිමිකම්ලාභියාගේ අත්සන: ..............................

### C කොටස

**(රු .600,000/ ක මුල් රක්ෂණ වන්දි මුදල චෙක්පත් මගින් ලබා ගත් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී හි තැන්පත්කරුවන් පමණක් මෙම C කොටස සම්පූර්ණ කළ යුතු ය.)**

1. තැන්පතුකරු/නීත්‍යනුකූල හිමිකම්පාන්නාගේ බැංකු ගිණුම් විස්තර (ඉතිරි වන්දි මුදල් බැර කරනු ලබන්නේ මෙම ගිණුමට ය)

1.1 ගිණුම් හිමියාගේ නම: - ..............................

1.2 බැංකුවේ නම: -.................. 1.3 බැංකු ගිණුම් අංකය :-..................

1.4 ගිණුම පවත්වාගෙන යනු ලබන බැංකු ශාඛාවේ නම: - ..............................

(සනාථ කිරීම සඳහාඉතුරුම් පාස් පොතේ හෝ බැංකු ගිණුම් ප්‍රකාශයක පිටපතක් අමුණා තිබිය යුතුය.)

මෙහි දක්වා ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මම මෙයින් සනාථ කර සහතික කරමි. ඉහත විස්තර අනුව යටතේ ගෙවනු ලබන මා හට හිමි ඉතිරි වන්දි මුදල් ඉහත දැක්වූ බැංකු ගිණුමට බැර කිරීම සම්බන්ධයෙන් එකඟ වන බව ද මෙයින් ප්‍රකාශ කරමි.

තැන්පත්කරු/නීත්‍යනුකූල හිමිකම්ලාභියාගේ අත්සන: ..............................